



## පොහොර යෙදීම

මිදි පැලය සිටුවා සති දෙකකින් පමණ පසු නයිට්‍රජන් අධික පලතුරු පොහොර මිශ්‍රණයක් යොදා මාස 06 කින් පමණ පසු මිදි පොහොර මිශ්‍රණය මාසයකට එක් වතාවක් බැගින් යොදා පැලයේ වර්ධනය ඒකාකාරීව පවත්වාගෙන යන්න.

## ඵල හට ගැන්වීම

වෙනත් පලතුරු වලට මෙන් ජලය සහ පොහොර යෙදීමෙන් පමණක් මිදිවල ඵලදාව ලබාගැනීමට නොහැක. අනිවාර්යයෙන්ම කප්පාදු කල යුතුය. මිදි වැලට වසරක් පමණ ගිය පසු අප සවිකල ආධාරකයේ හොඳින් මිදිවැල පැතිරී ඇත්නම් ඉදිරිකාලය වර්ෂාව නොලැබෙන කාලයක් නම් මිදිවැලට ජලය සැපයීම නවත්වන්න. මේ අවධිය වනවිට මිදිවැලේ පත්‍ර කහපාට වීම ආරම්භ වී තිබීමට පුළුවන. කෙසේ වුවද ජලය නැවතීමත් සමග මිදිවැලෙහි කොළ වියැලී මිය යාමට එනබව පෙනේවි. ඉන්පසු සතියකින් පමණ පසු සියලුම කොල සහ ළපටි රිකිලි සියල්ල කපා ඉවත් කරන්න. එදිනම ජලය එකතුකර පසු දින උදේ කැපූ රිකිලි කෙලවර ජලබිංදු එකතු වී ඇත්නම් සාර්ථකය. දින තුනකට පමණ පසු මිදි පොහොර (වෙළඳ පොලේ මිළදී ගැනීමට ඇත.) ග්‍රෑම් 300 පමණ බඳුනට දමා ජලය එකතු කරන්න. (බඳුනට පොහොර යොදන විට බඳුන අයින වටේට පොහොර යොදන්න) ඉන්පසු දළු සමග මල් පොකුරු හටගැනීම දැක ගත හැක. මිදිවැල් කල්යත්ම වැඩි ඵලදාවක් ලබාදේ.

## මිදිවල ඇඹුල් නැතිවීමට

මිදි ප්‍රභේද අනුව මල් හට ගෙන ඵලදාව ලබාගන්නා කාලය වෙනස් වේ. ඊශ්‍රායෙල් බ්ලු මාස 3 – 3 1/2 දක්වාද, කාඩිනල් මාස 2 සිට 2 1/2 දක්වාද ගතවේ. මල් හටගෙන ඵලදාව ලබාගන්නා කාලය වර්ෂාව නොලැබෙන කාලයක් වීම ඉතා අගනේය. මිදිවැලේ ඵලදාව හටගෙන ගෙඩි ඉදීමට පටන් ගන්නා අවධියේදී 50% පමණ ගෙඩි පාට වූවාට පසු මිදි වැලට ජලය ලබාදීම නවත්වන්න. ක්‍රමයෙන් මිදිවැල වියැලෙන්නට හරින්න. මිදි ගෙඩි සියල්ල ඉදුනාට පසු මිදි පොකුරු ඉවත් කර ගන්න. ජලය නවත්වනවාත් සමග මිදිවල ඇති ඇසිඩ් ගතිය තුරන් වී පැණි රස බවට පත්වේ. ඒ නිසා ජලය හොඳින් පාලනය කර ගැනීම තුලින් මිදිවල පැණි රසය ඉස්මතු කරගත හැක. ඒ අනුව මිදි පැණිරස හෝ ඇඹුල් රසය තීරණය වනු ලබන්නේ අවසාන අවධියේ යොදන ජලයයි. මිදි ඵල නෙලා නැවත පෙරසේ පූර්ණ කප්පාදුවක් කිරීම සුදුසුය. මෙය බඳුනක පමණක් නොව ගෙවත්තේ බිම සිටුවා ගන්නා මිදි වැලටත් එකසේ කළයුතු කාරියකි.

## වැළඳෙන හානි

මිදි වලට ඉතා විරල කෘමි හානි නොවුනත්, පරිසර හිතකාමී කොහොඹ ඇට දියර යෙදීම සුදුසුය. යටිපස් රෝගය හා පිටි පුස් රෝගය දැකීමට හැක. යටිපුස් රෝගයට තඹ අඩංගු දිලීර නාශකයක් සුදුසු අතර, පිටිපුස් රෝගය සඳහා සල්ෆර් අඩංගු දිලීර නාශකයක් යෙදීම සුදුසුය. විශාල වගාවන්ට එන රෝගී තත්වයන්, සුලු වෙන් කරන වගාවකට තදින් බල නොපාන අතර, මිදි වැලක් බඳුනක සිටුවා ව්‍යාපාරික මට්ටමේ ආදායම් උපයා ගැනීමට නොහැකි වුවත්, අපේ පුංචි ගෙවත්තේ හෝ සඳළුතලයේ බඳුනක මිදි වැලක මිදි පොකුරු කීපයක් සෑදී ඇත්නම් ඇත්තටම විශ්මිත වැඩක් නොවේද



උද්‍යාන භෝග වගා උපදේශක – කටානේ
**ඩබ්ලිව්. එච්. රණවීර.**

